# පාරිසරික සංචාරක කර්මාන්තය හා ප්‍රාදේශිය සංවර්ධනය: ශ්‍රී ලංකාවේ නකල්ස් රක්ෂිතයේ විභවතා හා සංරෝධක පිළිබඳ අධ්‍යයනයක්.

එච්.ඒ. නිශාන්ත හෙට්ටිආරච්චි
භූගෝලවිද්‍යා අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

දර්ශනපති 2007

# පාරිසරික සංචාරක කර්මාන්තය හා ප්‍රාදේශීය සංවර්ධනය: ශ්‍රී ලංකාවේ නකල්ස් රක්ෂිතයේ විභවතා හා සංරෝධක පිළිබඳ අධ්‍යයනයක්.


හෙට්ටිආරච්චිගේ නිශාන්ත හෙට්ටිආරච්චි

GS/SS/1549/2002

භූගෝලවිද්‍යා අධ්‍යයනාංශය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය


ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දර්ශනපති උපාධි පරීක්ෂණය සඳහා භූගෝලවිද්‍යා විෂයය යටතේ ඉදිරිපත් කරනු ලබන ස්වාධීන නිබන්ධය

2007.09.24

## කර්තෘත්ව සහතිකය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දර්ශනපති භූගෝලවිද්‍යා උපාධිය සඳහා මා විසින් ඉදිරිපත් කරනු ලබන මෙම ස්වාධීන නිබන්ධය මහාචාර්ය වයි.ඒ.ඩී.එස්. වනසිංහ මහත්මියගේ සහ ආචාර්ය ටී.එම්.එස්.පී.කේ. තෙන්නකෝන් මහත්මියගේ සුපරීක්ෂණය යටතේ සම්පාදනය කරනු ලැබූ බවත්, මෙම පර්යේෂණ කෘතිය කොටස් වශයෙන් හෝ සම්පූර්ණ වශයෙන් හෝ වෙනත් කිසිඳු විශ්විද්‍යාලයකට හෝ වෙනත් උසස් අධ්‍යාපන ආයතනයකට හෝ වෙනත් පශ්වාද් උපාධියක් / ඩිප්ලෝමාවක් සඳහා හෝ ඉදිරිපත් නොකරන ලද බවත් සහතික කරමි.

දිනය 25.03.2008

එච්.ඒ. නිශාන්ත හෙට්ටිආරච්චි

මෙම අපේක්ෂකයා විසින් කරන ලද ප්‍රකාශය සත්‍ය බවත්, මෙම නිබන්ධය ආරම්භයේ සිට අවසානය දක්වා අපගේ සුපරීක්ෂණය යටතේ සිදුකරන ලද බවත්, එය ඇගයීම් කාර්යය සඳහා විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කිරීමට සුදුසු බවත් නිර්දේශ කරමු.

දිනය 25.03.2008

-----------------------------------
මහාචාර්ය වයි.ඒ.ඩී.එස්. වනසිංහ
උපදේශක

දිනය 25.03.2008

-----------------------------------
ආචාර්ය ටී.එම්.එස්.පී.කේ. තෙන්නකෝන්
සම උපදේශක

භූගෝලවිද්‍යා අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
ගංගොඩවිල
නුගේගොඩ

25 MAR 2008

# පටුන


| | |
|---|---|
| පටුන | i - iv |
| සිතියම් නාමාවලිය | v |
| ප්‍රස්තාර නාමාවලිය | vi - vii |
| වගු නාමාවලිය | viii – x |
| රූප සටහන් නාමාවලිය | xi |
| ඡායාරූප නාමාවලිය | xii – xiii |
| පිදුම | xiv |
| ස්තුතිය | xv – xvi |
| සංක්ෂිප්තය | xvii - xviii |

පටුන | පිටුව


**පළමුවන පරිච්ඡේදය - හැඳින්වීම** 1 - 22

1.1 අධ්‍යයනයේ වැදගත්කම 1 - 6

1.2 අධ්‍යයනයේ අරමුණු 6 - 7

1.3 අධ්‍යයනයේ සීමා 7 - 9

1.4 ක්‍රමවේදය 9 - 20

1.4.1 අධ්‍යයන ප්‍රදේශය තෝරාගැනීම 9 - 11

1.4.2 නියැදිය තෝරාගැනීම 11 - 14

1.4.3 දත්ත රැස්කිරීම 14 - 20

1.5 දත්ත ඉදිරිපත් කිරීම සහ විශ්ලේෂණය 21 - 22

**දෙවන පරිච්ඡේදය - ප්‍රාදේශීය සංවර්ධනය සහ පාරිසරික සංචාරක කර්මාන්තය** 23 - 74

2.1 ප්‍රාදේශීය සංවර්ධනය හා ප්‍රාදේශීය සංවර්ධනයේ අරමුණු 23 - 25

2.2 ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සංවර්ධන විෂමතා 26 - 37

2.3 ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රාදේශීය සංවර්ධන ප්‍රවේශ 37 - 41

2.4 පාරිසරික සංචාරක කර්මාන්තය හැඳින්වීම 41 - 51

2.5 ලෝකයේ පාරිසරික සංචාරක කර්මාන්තය 51 - 59

2.6 ශ්‍රී ලංකාවේ පාරිසරික සංචාරක කර්මාන්තය 59 - 62

2.7 පාරිසරික සංචාරක කර්මාන්තය හා ප්‍රාදේශීය සංවර්ධනය අතර ඇති සබඳතාවය 63 - 74

**තුන්වන පරිච්ඡේදය - නකල්ස් රක්ෂිත ප්‍රදේශය** 75 - 129

3.1 හැඳින්වීම 75 - 78

3.2 භූගෝලීය පිහිටීම 78 - 80

3.3 ප්‍රවේශ මාර්ග 81 - 82

3.4 භූ භෞතික තොරතුරු 82

3.4.1 භූ විෂමතාවය 83 - 84

3.4.2 භූ විද්‍යාව හා පස 84 - 86

3.4.3 දේශගුණය 87 - 91

3.4.4 වෘක්ෂලතා ආවරණය 91 - 97

3.4.5 ජලවහනය 98 - 100

3.4.6 ජෛව විවිධත්වය 101 - 106

3.5 සමාජ ආර්ථික හා සංස්කෘතික ලක්ෂණ 106 - 129

3.5.1 ප්‍රජා විද්‍යාත්මක තොරතුරු 106 - 109

3.5.2 ජනාවාස රටාව 109 - 111

3.5.3 නිවාස වල ස්වභාවය 111 - 112

3.5.4 ජීවනෝපාය මාර්ග 112 - 118

3.5.5 රැකියා නියුක්තිය 118 - 119

3.5.6 අධ්‍යාපන මට්ටම 119 - 122

3.5.7 යටිතල පහසුකම් 122 - 129

**හතරවන පරිච්ඡේදය - නකල්ස් රක්ෂිත ප්‍රදේශයේ පාරිසරික සංචාරක කර්මාන්තය** 130 - 204

4.1 සංචාරකයන්ගේ පැමිණීම 132 - 143

4.2 නකල්ස් රක්ෂිත ප්‍රදේශයේ පාරිසරික සංචාරක ක්‍රියාකාරකම් 144 - 151

4.3 නකල්ස් රක්ෂිතයේ පාරිසරික සංචාරක යටිතල පහසුකම් 151 - 158

4.4 නකල්ස් රක්ෂිත ප්‍රදේශයේ පාරිසරික සංචාරක කර්මාන්තය හා ප්‍රාදේශීය සංවර්ධනය සම්බන්ධ ආයතනික පසුබිම 158 - 162

4.5 නකල්ස් රක්ෂිතයේ පාරිසරික සංචාරක කර්මාන්තය නඟා සිටුවීමේදී ඇති විභවතා 162 - 183

4.5.1 ස්වභාවික හා කඳුකර ප්‍රදේශ ආශ්‍රිත පාරිසරික සංචාරක විභවතා 164 - 171

4.5.2 ජලාශ්‍රිත පාරිසරික සංචාරක විභවතා 172 - 175

4.5.3 වන සතුන් නැරඹීම හා අධ්‍යයනය ආශ්‍රිත පාරිසරික සංචාරක විභවතා 175

4.5.4 ප්‍රජා මූලික / කෘෂි පාරිසරික සංචාරක විභවතා 175 - 183

4.6 නකල්ස් රක්ෂිත ප්‍රදේශයේ පාරිසරික සංචාරක කර්මාන්තය ආශ්‍රිත සංරෝධක 183 - 204

4.6.1 නකල්ස් රක්ෂිත ප්‍රදේශය මුහුණපාන සංරෝධක 184 - 188

4.6.2 නකල්ස් රක්ෂිත ප්‍රදේශයේදී සංචාරකයන් මුහුණපාන ගැටලු 188 - 192

4.6.3 වෙනත් ගැටලු 192 - 195

4.7 නකල්ස් රක්ෂිත ප්‍රදේශයේ පාරිසරික සංචාරක කර්මාන්තය ආශ්‍රිත සංරෝධක මැඩලීම සඳහා ගතහැකි ක්‍රියාමාර්ග 195 - 204

**පස්වන පරිච්ඡේදය - නකල්ස් රක්ෂිත ප්‍රදේශයේ පාරිසරික සංචාරක කර්මාන්තය සහ ප්‍රාදේශීය සංවර්ධනය 205 - 247**

5.1 පාරිසරික සංචාරක කර්මාන්තය ප්‍රාදේශීය සංවර්ධනය කෙරෙහි දායක වී ඇති ආකාරය. 205 - 206

5.1.1 රැකියා අවස්ථා ජනනය කිරීම සහ ආදායම් උත්පාදනය 206 - 224

5.1.2 යටිතල පහසුකම් සංවර්ධනය 225 - 233

5.1.3 කෘෂිකාර්මික සංවර්ධනය 233 - 235

5.2 පාරිසරික සංචාරක කර්මාන්තය තුළින් ප්‍රාදේශීය සංවර්ධනය ළඟාකරගැනීමේදී අවධානය යොමුකළ යුතු අංශ 236 - 247

**හයවන පරිච්ඡේදය - නිගමන සහ යෝජනා 248 - 256**

6.1 නිගමන 247 - 254

6.2 යෝජනා 255 - 258

**ආශ්‍රිත ග්‍රන්ථ 259 - 276**

**උප ග්‍රන්ථය / ඇමුණුම්**

# සිතියම් නාමාවලිය


| අංකය | | පිටුව |
|---|---|---|
| 2.1 | පළාත් අනුව ඒක පුද්ගල ආදායම - 2005 | 29 |
| 3.1 | නකල්ස් රක්ෂිත ප්‍රදේශයේ සාපේක්ෂ පිහිටීම | 79 |
| 3.2 | නකල්ස් රක්ෂිත ප්‍රදේශයේ නිරපේක්ෂ පිහිටීම | 80 |
| 3.3 | නකල්ස් රක්ෂිත ප්‍රදේශයේ ප්‍රධාන කඳු පන්ති | 86 |
| 3.4 | නකල්ස් රක්ෂිත ප්‍රදේශයේ වෘක්ෂලතා ආවරණය | 92 |
| 3.5 | නකල්ස් රක්ෂිත ප්‍රදේශයේ ප්‍රධාන දියබෙත්ම | 100 |
| 3.6 | නකල්ස් රක්ෂිත ප්‍රදේශයේ ජන ඝනත්වය | 110 |
| 4.1 | නකල්ස් රක්ෂිත ප්‍රදේශයේ සංචාරක ආකර්ෂණයන් සහ ප්‍රවේශ මාර්ග | 131 |

# ප්‍රස්තාර නාමාවලිය


| අංකය | | පිටුව |
|---|---|---|
| 2.1 | පළාත් අනුව රැකියා වියුක්ති අනුපාතය - 2005 | 30 |
| 2.2 | නාමික දරිද්‍රතා රේඛාව සහ දරිද්‍රතා ජනගහන අනුපාතිකය - 2002 | 33 |
| 3.1 (අ. ආ.) | නකල්ස් රක්ෂිත ප්‍රදේශයේ මාසික සහ වාර්ෂික වර්ෂාපතන ව්‍යාප්තිය | 89 |
| 3.2 | නිවාස වල තත්ත්වය - ලග්ගල - පල්ලේගම සහ උඩුදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස - 2005 | 111 |
| 3.3 | එළවලු වගා බිම් ප්‍රමාණය සහ ගොවීන් සංඛ්‍යාව ලග්ගල - පල්ලේගම සහ උඩුදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස - 2005 | 115 |
| 3.4 | රැකියා නියුක්තිය - ලග්ගල - පල්ලේගම සහ උඩුදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස - 2005 | 119 |
| 3.5 | බලශක්ති භාවිතය - ලග්ගල - පල්ලේගම සහ උඩුදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස - 2005 | 124 |
| 3.6 | මූලාශ්‍ර අනුව ජල භාවිතය - ලග්ගල - පල්ලේගම සහ උඩුදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස - 2005 | 126 |
| 4.1 | නකල්ස් රක්ෂිත ප්‍රදේශයට සංචාරකයන්ගේ පැමිණීම - 2000 - 2005 | 132 |
| 4.2 | නකල්ස් රක්ෂිත ප්‍රදේශයට දේශීය සංචාරකයන්ගේ පැමිණීම - 2007 | 136 |
| 4.3 | ස්ත්‍රී පුරුෂ භාවය අනුව සංචාරකයන්ගේ පැමිණීම - 2007 | 138 |
| 4.4 | සංචාරකයන් උපයෝගී කරගන්නා විවිධ ප්‍රවාහන මාධ්‍යය | 140 |
| 4.5 | පාරිසරික සංචාරකයන්ගේ පැමිණීම සහ නවාතැන් ගත් දින ගණන | 141 |
| 4.6 | පාරිසරික සංචාරකයන් කඳවුරු බැඳීමට දක්වන රුචිකත්වය | 146 |
| 4.7 | පාරිසරික සංචාරකයන් ස්වභාවික මංපෙත් සංචාරයට දක්වන රුචිකත්වය | 150 |

| | | |
|---|---|---|
| 4.8 | සතියේ දින අනුව සංචාරකයන්ගේ පැමිණීම | 194 |
| 5.1 | නකල්ස් රක්ෂිත ප්‍රදේශයේ පාරිසරික සංචාරක කර්මාන්තය ආශ්‍රිත පූර්ණ කාලින සහ අර්ධ කාලින රැකියා නියුක්තිය - 2007 | 208 |
| 5.2 | පාරිසරික සංචාරක කර්මාන්තය ආශ්‍රිත රැකියා නියුක්තියේ ස්වභාවය - 2007 | 209 |
| 5.3 | නකල්ස් රක්ෂිත ප්‍රදේශයේ හෝටල් සහ සංචාරක නිකේතනවල රැකියා නියුක්තිකයන්ගේ ස්ථිර පදිංචිය | 213 |
| 5.4 | පාරිසරික සංචාරක කර්මාන්තයෙන් ලබන මාසික ආදායම | 220 |
| 5.5 | නවාතැන් පහසුකම් සපයන්නන් සංචාරකයන්ට දුරකථන පහසුකම් සැපයීමෙන් ලද ආදායම | 232 |

# වගු නාමාවලිය


| අංකය | | පිටුව |
|---|---|---|
| 1.1 | අධ්‍යයනය සඳහා තෝරාගනු ලැබූ ග්‍රාම නිළධාරී වසම් සහ පවුල් සංඛ්‍යාව | 12 |
| 2.1 | පළාත් අනුව දළ දේශීය නිෂ්පාදිතයට කරනු ලබන දායකත්වය - 2005 | 26 |
| 2.2 | පළාත් අනුව සාමාන්‍ය මාසික සහ මධ්‍ය මාසික ආදායම - 2005 | 28 |
| 2.3 | දිස්ත්‍රික්ක අනුව නිල දරිද්‍රතා රේඛාව මත පදනම් වු දිළිඳු ගෘහ ඒකකයන්ගේ ප්‍රතිශතය - 2002 | 32 |
| 2.4 (අ) | ස්ථාපිත කර්මාන්ත සංඛ්‍යාව සහ කාර්මික අංශයේ රැකියා නියුක්තිය - මහනුවර දිස්ත්‍රික්කය - 2003 | 36 |
| 2.4 (ආ) | ස්ථාපිත කර්මාන්ත සංඛ්‍යාව සහ කාර්මික අංශයේ රැකියා නියුක්තිය - මාතලේ දිස්ත්‍රික්කය - 2003 | 37 |
| 3.1 | නකල්ස් රක්ෂිත ප්‍රදේශයේ ප්‍රවේශ මාර්ග | 81 |
| 3.2 | නකල්ස් රක්ෂිත ප්‍රදේශයේ මධ්‍ය වාර්ෂික සහ මාසික උෂ්ණත්ව ව්‍යාප්තිය 1998 - 2005 | 90 |
| 3.3 | ජන සංඛ්‍යාව ලග්ගල - පල්ලේගම සහ උඩුදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස - 2005 | 107 |
| 3.4 | ජන සංයුතිය - ලග්ගල - පල්ලේගම සහ උඩුදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස - 2005 | 108 |
| 3.5 | වී වගා බිම් ප්‍රමාණය, ගොවීන් සංඛ්‍යාව, ඒක පුද්ගල බිම් ප්‍රමාණය සහ අස්වැන්න ලග්ගල - පල්ලේගම සහ උඩුදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස - 2005 | 113 |
| 3.6 | හේන් වගා බිම් ප්‍රමාණය, ගොවීන් සංඛ්‍යාව සහ අස්වැන්න ලග්ගල - පල්ලේගම සහ උඩුදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස - 2005 | 116 |
| 3.7 | පාසල් සහ ශිෂ්‍ය සංඛ්‍යාව - ලග්ගල - පල්ලේගම සහ උඩුදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස - 2005 | 120 |

| | | |
|---|---|---|
| 3.8 | අධ්‍යාපන මට්ටම් අනුව ජන සංඛ්‍යාව ලග්ගල - පල්ලේගම සහ උඩුදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස - 2007 | 121 |
| 3.9 | සෞඛ්‍ය පහසුකම් - ලග්ගල - පල්ලේගම සහ උඩුදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස - 2005 | 125 |
| 3.10 | සනීපාරක්ෂක පහසුකම් - ලග්ගල - පල්ලේගම සහ උඩුදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස - 2005 | 127 |
| 4.1 | නකල්ස් රක්ෂිත ප්‍රදේශයට සංචාරකයන්ගේ පැමිණීම හා ලැබූ ආදායම 1996 - 2005 | 134 |
| 4.2 | නකල්ස් රක්ෂිත ප්‍රදේශයට විදේශීය සංචාරකයන්ගේ පැමිණීම - 2007 | 137 |
| 4.3 | වයස් කාණ්ඩ අනුව සංචාරකයන්ගේ පැමිණීම - 2007 | 139 |
| 4.4 | සංචාරකයන් නකල්ස් රක්ෂිත ප්‍රදේශය පිළිබඳ දැනුවත් වූ මාධ්‍යය | 142 |
| 4.5 | නකල්ස් රක්ෂිත ප්‍රදේශය නැරඹීමට පැමිණි සංචාරකයන්ගේ විවිධ අරමුණු | 143 |
| 4.6 (අ) | නකල්ස් රක්ෂිත ප්‍රදේශයේ ස්වභාවික මංපෙත් පිහිටීම - දුර ප්‍රමාණය හා සංචාරක ආකර්ෂණ (පා ගමන්) | 148 |
| 4.6 (ආ) | නකලස් රක්ෂිත ප්‍රදේශයේ ස්වභාවික මංපෙත් පිහිටීම - දුර ප්‍රමාණය හා සංචාරක ආකර්ෂණ (යතුරු පැදි හා පා පැදි) | 149 |
| 4.7 | සංචාරකයන් කැළි කසළ බැහැරකරන ලද විවිධ ක්‍රම | 185 |
| 4.8 | නකල්ස් රක්ෂිත ප්‍රදේශයේ දී සංචාරකයන් මුහුණ පාන විවිධ ගැටලු | 189 |
| 5.1 | සංචාරක නිකේතන සහ හෝටල් ආශ්‍රිත රැකියා නියුක්තිය - 2007 | 212 |
| 5.2 | සුළු පරිමාණ වෙළෙඳුන් තම නිෂ්පාදන අලෙවිකරන ආකාරය | 217 |
| 5.3 | පාරිසරික සංචාරක කර්මාන්තය ආශ්‍රිත කාන්තා රැකියා නියුක්තිය - 2007 | 221 |
| 5.4 | නකල්ස් රක්ෂිත ප්‍රදේශයේ සංචාරක නිකේතන හා අයකිරීම් ගාස්තු | 226 |

5.5 රක්ෂිත ප්‍රදේශයේ සංචාරක නිකේතනයන්ට පැමිණි සංචාරකයන්ගේ සංඛ්‍යාව - 2007 ජනවාරි - මාර්තු 227

5.6 පුද්ගලික අංශය නවාතැන් සැපයූ සංචාරකයන් සංඛ්‍යාව සහ ලැබූ ආදායම - 2007 ජනවාරි - මාර්තු 229

# රූප සටහන් නාමාවලිය


| අංකය | | පිටුව |
|---|---|---|
| 2.1 | පාරිසරික සංචාරක කර්මාන්තය ආශ්‍රිත ප්‍රාදේශීය සංවර්ධන සැලසුම් තුළින් ලැබෙන විවිධ ප්‍රතිලාභ | 66 |
| 4.1 | නකල්ස් රක්ෂිත ප්‍රදේශයේ පාරිසරික සංචාරක කර්මාන්තය නංවාලීමට ඇති විභවතාවය | 163 |
| 5.1 | පාරිසරික සංචාරක කර්මාන්තය ආශ්‍රිත රැකියා සහ ආදායම් උත්පාදන මාර්ග - 2007 | 211 |
| 5.2 | සුළු ව්‍යාපාරික ප්‍රජාව භාණ්ඩ එක් රැස්කරන විවිධ මාධ්‍යය | 219 |
| 5.3 | පාරිසරික සංචාරක කර්මාන්තයෙන් නකල්ස් රක්ෂිත ප්‍රදේශයට ආදායම් ලැබන ආකාරය | 235 |

# ඡායාරූප නාමාවලිය


| අංකය | | පිටුව |
|---|---|---|
| 3.1 | නකල්ස් කඳු වැටිය | 83 |
| 3.2 | තෙත් නිවර්තන අර්ධ සදාහරිත වනාන්තර | 96 |
| 3.3 | නිවර්තන උප කඳුකර අර්ධ සදාහරිත වනාන්තර | 96 |
| 3.4 | තෙත් අර්ධ සදාහරිත වනාන්තර | 96 |
| 3.5 | කඳුකර තෘණ භූමි | 97 |
| 3.6 | පිග්මි වනාන්තර | 97 |
| 4.1 | නකල්ස් රක්ෂිත ප්‍රදේශයේ පාරිසරික සංචාරක මංපෙත් | 155 |
| 4.2 | ඩීන්ස්ටන් උද්‍යානයේ පාරිසරික සංචාරක ලැගුම්හලක් | 155 |
| 4.3 | කුරුළු නැරඹුම් කුළුණු | 156 |
| 4.4 | ඩීන්ස්ටන් උද්‍යානයේ තොරතුරු මධ්‍යස්ථානය | 156 |
| 4.5 | නකල්ස් රක්ෂිතයේ කඳුවුරු බිමක් | 157 |
| 4.6 | ඩීන්ස්ටන් මාර්ගෝපදේශන මධ්‍යස්ථානය | 157 |
| 4.7 | දිසා පුවරු, දැන්වීම් පුවරු සහ නාම පුවරු | 158 |
| 4.8 | පිටවල පතන | 169 |
| 4.9 | ලකේගල | 170 |
| 4.10 | ක්‍රොබර්ට්ස් දුර්ගය | 170 |
| 4.11 | කුඩා ලෝකාන්තය | 171 |
| 4.12 | මානින්ගල | 171 |

| | | |
|---|---|---|
| 4.13 | තෙලිගමු ඔයේ පාරිසරික සංචාරක ක්‍රියාකාරකම් | 174 |
| 4.14 | හින් ගඟ | 174 |
| 4.15 | දූවිලි ඇල්ල | 175 |
| 4.16 | සම්ප්‍රදායික ක්‍රමයට කොල මැඩීම | 182 |
| 4.17 | (අ) (ආ) මී මුරේ ගම්මානය | 182 - 183 |
| 4.18 | තෙලිගමුව ඔය පාරිසරික සංචාරක ආකර්ෂණයේ කැළි කසළ අක්‍රමවත් ලෙස බැහැර කර ඇති ආකාරය | 187 |
| 4.19 | නකල්ස් ප්‍රදේශයේ කඳු හා වනාන්තර විනාශය. | 188 |
| 4.20 | නකල්ස් රක්ෂිත ප්‍රදේශය තුළ ක්‍රමානුකූලව කැලි කසල බැහැරලීම | 196 |
| 5.1 | රත්තොට ඉළුක්කුඹුර ප්‍රවේශ මාර්ගයේ කෘෂි නිෂ්පාදන අලෙවිය | 218 |
| 5.2 | මී මුරේ ගම්මානයේ පෞද්ගලික නවාතැන් සැපයීම පිළිබඳ දැන්වීමක් | 230 |
| 5.3 | ඩින්ස්ටන් උද්‍යානයේ කඳවුරු බිම් සඳහා ජලය සැපයීම. | 230 |

පිදුම

ලෝකය දකින්නට

දෙනෙතක් වූ

ආදරණීය

අම්මාට

# ස්තුතිය

විශ්වවිද්‍යාල ජීවිතයේදී පමණක් නොව ඉන් පසුවද ඉහළට ඉගෙනගන්නට මග පෙන්වමින් දර්ශනපති උපාධිය දක්වා එන්නට තරම් දැනුම, මග පෙන්වීම, උපකාරය ලබාදුන් උපදේශක මහාචාර්ය වයි.ඒ.ඩී.එස්. වනසිංහ ඇදුරුතුමිය

භූගෝලවිද්‍යා අධ්‍යයනාංශයේ හිටපු ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එම්.එම්. කරුණානායක සහ මහාචාර්ය එම්.ඩී.සී. අභයරත්න ගුරු පියවරුන්

අධ්‍යයනාංශය තුළදී දැනුම මගපෙන්වීම ලබාදෙමින් යා යුතු මග නිවැරදි කරදුන් සම උපදේශක ආචාර්ය සුනේත්‍රා තෙන්නකෝන් ඇදුරුතුමිය

ආචාර්ය ආර්.එම්.කේ. රත්නායක, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ශාන්ත විජේසිංහ සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පින්නවල සංඝසුමන හිමි ඇතුළු භූගෝලවිද්‍යා අධ්‍යයනාංශයේ සියලුම ආචාර්ය මණ්ඩලය

උසස් පෙළ පන්තියේ සිට අද මේ දක්වාත් සෙනෙහසින් ඔවදන් දෙමින් මා යන ගමන් මග නිවැරදිම කරන්නට මග පෙන්වන මගේ මුල්ම භූගෝලවිද්‍යා ඇදුරුතුමිය ආර්.එල්.බී. දමයන්ති ගුරු මෑණියන්

වසර ගණනාවක් නොවෙනස් මිතුරු දමින් මේ දක්වා දුරක් එන්නට අනේකවිද උදව් උපකාර සහ කැපකිරීම් කළ ගණකාධිකරණ අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය චමින්ද උදයශාන්ත සොයුරා

කාර්යාල ජීවිතයේදී ලැබෙන මද විරාමයත් අධ්‍යයන කටයුතු සඳහා කැපකිරීම ගැන කිසිවිටකත් දොස් නොකියා මා දිරිමත් කළ ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ - පර්යේෂණ වෙරන්ජන් කුරුකුලසූරිය මහතා

සංචාරක සේවා අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන) එන්. හේමා ධර්මවර්ධන මහත්මිය

පොත පත සොයාගන්නට පුස්තකාලයට පැමිණි සෑම මොහොතකම අදිමදිකිරීමකින් තොරව උදව් උපකාර කළ විශ්වවිද්‍යාලයීය ප්‍රධාන පුස්තකාලයේ අනිල් ශාන්ත වඩුගේ සොයුරා

වන සම්පත් දෙපාර්තමේන්තුවේ පුස්තකාලයාධිපතිනී සුමනා ගී කියනගේ මහත්මිය - පුස්තකාල සහකාර පී. කේ. ඩී. ප්‍රේමරත්න මහතා

වන සම්පත් දෙපාර්තමේන්තුවේ ඩින්ස්ටන් සහ ඉළුක්කුඹුර අඩවි වන නිළධාරී මහත්වරුන් සහ සංචාරක නිකේතන භාරකරුවන්

නිබන්ධයක්, සම්මන්ත්‍රණ පත්‍රිකාවක් සකස් කරදුන් සැනින් ප්‍රමාදයකින්, මැසිවිල්ලකින් තොරව පරිගණකගත කරදුන් නාගරික සංවර්ධන අධිකාරියේ බලාත්මක අංශයේ ජීවනී දිල්රුක්ෂි සොයුරිය

ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයීය පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ අනුලා, මහේෂ්, මංජුලා, අකිල, රිස්වි ඇතුළු සියලුම කාර්ය මණ්ඩලය

නාවලපිටිය ප්‍රාදේශීය ලේකම් සිරිමෙවන් ධර්මසේන සොයුරා

ජන ලේඛන සහ සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ රංජිත් වීරසේකර සොයුරා

ලග්ගල - පල්ලේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මල්ලිකා ජයවර්ධන සොයුරිය

උඩුදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දීපිකා ඒකනායක සොයුරිය - ගාමිණී රත්නායක සොයුරා

මාතලේ නොරිටාකේ පෝසිලේන් සමාගමේ සුජාතා එගොඩගෙදර සොයුරිය

මී මුරේ ලලිත් බණ්ඩාර හේරත් සොයුරා සහ දෙමාපියන්

රත්තින්දේ සමන්, වල්පලාමුල්ලේ දිනුෂා, හුන්නස්ගිරියේ නිශ්ශංක, පිටවලගම පසිඳු යන සොයුරු සොයුරියන්

සුන්දර නකල්ස් කඳුකරයේ හුදෙකලා ගම්මානයන්හි සියලුම ගම් වැසියන්

**මේ දුෂ්කර ව්‍යායාමයේදී ඔබ දුන් ශක්තිය මගේ ධෛර්යයට හේතුවිය. ඔබ සැමට මගේ ගෞරවනීය ස්තූතිය හිමිවේ.**

## සංක්ෂිප්තය

### පාරිසරික සංචාරක කර්මාන්තය හා ප්‍රාදේශීය සංවර්ධනය: ශ්‍රී ලංකාවේ නකල්ස් රක්ෂිතයේ විභවතා හා සංරෝධක පිළිබඳ අධ්‍යයනයක්.

සංචාරක කර්මාන්තයේ කාලීන වර්ධනය හා විකාශනය පිළිබඳව විමසා බැලීමේ දී පසුගිය දශක කිහිපයක කාලය තුළදී ක්ෂේත්‍රය තුළ විවිධ මානයන් හා සංකල්ප ගොඩනැගී ඇති බව පැහැදිලි කරුණකි. ප්‍රවාහන හා සන්නිවේදන පහසුකම් වල සිදු වූ සීඝ්‍ර සංවර්ධනයත් සමගම ඇති වූ මෙම නව සංකල්ප අතර වඩාත් වැදගත් සංකල්පයක් වන්නේ පාරිසරික සංචාරක කර්මාන්තයයි. 1980 දශකය ආරම්භයේදී ඇතිවූ මෙම නවතම සංකල්පය මහා පරිමාණ හා වාණිජකරණය වූ සංචාරක කර්මාන්තයෙන් ඇතිවන අහිතකර බලපෑම් සඳහා කදිම විසඳුමක් වී ඇත.

ලෝකයේ සංවර්ධනය වෙමින් පවතින රටවල් වැදගත් ප්‍රාදේශීය සංවර්ධන ක්‍රමෝපායයක් ලෙස පාරිසරික සංචාරක කර්මාන්තය හඳුනාගෙන ඇත. ප්‍රාදේශීය සංවර්ධනයේදී ළඟාකරගැනීමට අපේක්ෂිත බහුවිධ අරමුණු මුදුන් පමුනුවාගැනීමේ මාධ්‍යයක් ලෙසත් විදේශ විනිමය ඉපයීමේ ප්‍රධාන මාධ්‍යයක් ලෙසත් මෙම රටවල් පාරිසරික සංචාරක කර්මාන්තය හඳුනාගන ඇත.

වර්තමාන ලෝකයේ පාරිසරික සංචාරක කර්මාන්තය හා ප්‍රාදේශීය සංවර්ධනය යන මාතෘකාව පුළුල් ලෙස අධ්‍යයනය කෙරෙමින් පවතී. ශ්‍රී ලංකාවේ ද නාගරීකරණය, නවීකරණය හා කාර්මීකරණය සීඝ්‍රයෙන් සිදුවෙමින් පවතින යුගයක ප්‍රාදේශීය සංවර්ධන විෂමතා පැනනැගීමද අනිවාර්යයෙන්ම සිදුවේ. මේ නිසා ඇතිවන ප්‍රාදේශීය සංවර්ධන විෂමතා හඳුනාගැනීමේදීත්, ඒවාට හේතු සාධක අධ්‍යයනය කිරීමේදීත්, ප්‍රාදේශීය සංවර්ධන විෂමතා අවමකිරීමට ගතහැකි ක්‍රියාමාර්ග හඳුනාගැනීමේදීත් පාරිසරික සංචාරක කර්මාන්තය වැනි නැවුම් ප්‍රවේශයන් ඉතා වැදගත් වේ.

පාරිසරික සංචාරක කර්මාන්තය නගා සිටුවීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ නකල්ස් රක්ෂිත ප්‍රදේශය සතුව ඉහළ විභවතාවයක් පවතී. මෙම ප්‍රදේශය පිළිබඳව දේශීය විදේශීය පර්යේෂකයන් විසින් සිදුකර ඇති පර්යේෂණ සංඛ්‍යාව අතිවිශාල වුවත් මෙවැනි ප්‍රවේශයකින් සිදුකරනු ලබන ප්‍රථම පර්යේෂණය මෙය වේ. ශ්‍රී ලංකාවේ නකල්ස් රක්ෂිත ප්‍රදේශයේ පාරිසරික සංචාරක කර්මාන්තය නගා සිටුවීමෙහිලා ඇති විභවතා හා සංරෝධක අධ්‍යයනය කර, එය එම ප්‍රදේශයේ ප්‍රාදේශීය සංවර්ධනය සඳහා කොතෙක් දුරට දායකකරගත හැකිදැයි විමර්ශනය කිරීමේ මූලික අරමුණ සහ නකල්ස් රක්ෂිත ප්‍රදේශයේ වර්තමාන පාරිසරික සංචාරක ක්‍රියාකාරකම් හඳුනාගැනීම, පාරිසරික සංචාරක

විභවතා හඳුනාගැනිම හා වැඩි දියුණු කළ හැකි අංශ හඳුනාගැනිම මෙන්ම එම ක්‍රියාකාරකම් අධ්‍යයන ප්‍රදේශයේ සංවර්ධනයට කෙතෙක් දුරට දායක වී ඇත්දැයි විමර්ශනය කිරිම ආදී අවශේෂ අරමුණු ඇතිව මෙම පර්යේෂණය සිදුකරන ලදි.

ශාස්ත්‍රිය පර්යේෂණයක් සිදුකිරිමේ දි බහුලව භාවිතාකරනු ලබන මූලික ක්‍රමවේදයන් වන දත්ත රැස්කිරිම, විග්‍රහ කිරිම, විවිධ දත්ත විශ්ලේෂණ ක්‍රම භාවිතය ආදී ක්‍රමවේදයන් අනුගමනය කරමින් මෙම පර්යේෂණය සිදුකරන ලදි. ඒ අනුව මෙම පර්යේෂණ නිබන්ධය ප්‍රධාන අංශ කිහිපයක් ඔස්සේ සකස් කර ඇත. පර්යේෂණ ගැටලුව හැඳින්වීම, අධ්‍යයනයේ වැදගත්කම, අරමුණු හා ක්‍රමවේදය, යනාදිය පළමුවන පරිච්ඡේදයෙන් ද, දෙවන පරිච්ඡේදයෙන් පාරිසරික සංචාරක කර්මාන්තය හා ප්‍රාදේශිය සංවර්ධනය ට අදාළ න්‍යායාත්මක සංකල්පයන් ද, තුන්වන පරිච්ඡේදයෙන් අධ්‍යයන ප්‍රදේශයේ තොරතුරු ද සිව්වන පරිච්ඡේදයෙන් නකල්ස් රක්‍ෂිතය ආශ්‍රිත පාරිසරික සංචාරක කර්මාන්තයේ වර්තමාන තත්ත්වය, විභවතා සහ සංරෝධකද පස්වන පරිච්ඡේදයෙන් නකල්ස් රක්‍ෂිතය ආශ්‍රිත පාරිසරික සංචාරක කර්මාන්තය හා ප්‍රාදේශිය සංවර්ධනය කෙරෙහිද අවධානය යොමුකර ඇත.

සංවර්ධනය වෙමින් පවතින රටවල් ප්‍රාදේශිය සංවර්ධන ප්‍රවේශයක් වශයෙන් ඉතාමත් සාර්ථකව උපයෝගි කරගෙන ඇති පාරිසරික සංචාරක කර්මාන්තය, රැකියා සැපයිම, යටිතල පහසුකම් සංවර්ධනය, සමාජ සංස්කෘතික සංරක්ෂණය සහ කෘෂිකාර්මික සංවර්ධනය ආදී විවිධ අංශ සංවර්ධනය ඔස්සේ ශ්‍රි ලංකාවේ නකල්ස් රක්‍ෂිත ප්‍රදේශයේ සමාජ ආර්ථික සංවර්ධනය සඳහා කෙතෙක් දුරට දායකකරගත හැකිද යන්න මෙම පර්යේෂණය තුළින් විමර්ශනශිලිව අධ්‍යයනය කරනු ලැබේ. එහෙයින් ශ්‍රි ලංකාවේ සමාජ ආර්ථික සහ ප්‍රාදේශිය සංවර්ධන සැලසුම් වලදි මෙම පර්යේෂණය ඉතා ප්‍රයෝජනවත් වනු ඇත.

**එච්.ජී. නිශාන්ත හෙට්ටිආරච්චි**
**භූගෝලවිද්‍යා අධ්‍යයනාංශය**
**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**